සැ. යු. - 2023.10.06 දින පළකරන ලද අංක 2353 *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,354 - 2023 ඔක්තෝබර් මස 13 වැනි සිකුරාදා - 2023.10.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 574 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 575 |


*සැ. යු.-* (i) විසර්ජන පනත් කෙටුම්පත 2023 සැප්තැම්බර් මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) මුදල් පනත් කෙටුම්පත 2023 සැප්තැම්බර් මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2023 නොවැම්බර් මස 03 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 ඔක්තෝබර් මස 20 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## නුගේගොඩ දිසා අධිකරණයේ දී ය

## පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

එච්. එන්. බී. ෆිනෑන්ස් පී.එල්.සී.
(සමාගම් පනතේ VIII පරිච්ඡේදය ප්‍රකාර ව ඒකාබද්ධ වීමට පෙර ප්‍රයිම් ෆයිනෑන්ස් පී.එල්.සී. යනුවෙන් හඳුන්වනු ලැබූ) ලියාපදිංචි සහ හෝ ප්‍රධාන කාර්යාලය,
අංක 168, නාවල පාර, නුගේගොඩ.

*....................පැමිණිලිකරු.*

නඩු අංකය : DMB/29/2020
(කොළඹ දිසා අධිකරණ)
ස්වභාවය : උකස්
කාර්යපටිපාටිය : සාමාන්‍ය
වටිනාකම : රු. 7,455,004/-
ඇස්කිසි අංකය : 01/2023 (නුගේගොඩ දිසා අධිකරණ)

*එදිරිව*

01. පන්නිල මල්ලිකාගේ නිලන්ති ශිරෝමාලී,
අංක 95, ජනතා මාවත, මහරගම.

02. පන්නිල මල්ලිකාගේ විල්බට්,
අංක 04, බෝගහ හංදිය, පරණ පාර, නාවින්න, මහරගම.

*සහ දැනට දෙදෙනාම :*

අංක 02, හයිලෙවල් පාර, මහරගම
*..................විත්තිකරුවන්.*

ඉහත අංක දරන නඩුවේ මා වෙත නිකුත් කර ඇති රිට් බලපත්‍රය අනුව කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවේ 2021.01.29 දින පැමිණිල්ල හා පළවන විත්තිකාරිය අතර ඇතිකරගත් සමථය අනුව කටයුතු කිරීමට අපොහොසත් වී සහ/හෝ පැහැර හැර ඇති බැවින් සමථ තීන්දු ප්‍රකාශයක් ගොනුකර සමථය කඩ වූ බවට පැමිණිල්ල විසින් දිවුරුම් ප්‍රකාශයක් ගොනු කිරීමෙන් පසු සලකා බලා පළවන විත්තිකාරියට එරෙහි ව ඇස්කිසි ගැනීමට පැමිණිල්ලට අවසර ලබා දී ඇති බැවින්,

පළවන විත්තිකාරියගෙන් පැමිණිල්ලට අයවිය යුතු රුපියල් හැටහතර ලක්ෂ හතලිස් පන්දහස් හතර (රු. 6,445,004/-) ක මුදල සහ ඇස්කිසි ගාස්තු අයකරවා ගැනීම සඳහා පහත උපලේඛනගත නිශ්චල දේපළ.

**වර්ෂ 2023ක් වූ නොවැම්බර් මස 15 වැනි දින පෙ. ව. 10.30** ට උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ පිහිටි අංක 95, ජනතා මාවත, මහරගම යන ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ පල්ලේ පත්තුවේ, මහරගම මහනගර සභා සීමාව තුළ මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහරගම 527 ඒ ග්‍රාම නිලධාරී වසමේ, මහරගම ජනතා මාවතේ, වරිපනම් අංක 95 හි පිහිටි ''පෙලෙන්ගහවත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්නගේ අංක 6318 සහ වර්ෂ 2012ක් වූ ඔක්තෝබර් මස 30 වැනි දින දරන ප්ලෑන ප්‍රකාරව ලොට් බී 2 බී දරන ඉඩමට මායිම් : උතුරට සහ දකුණට අඩි 8 පළල පාර ද, (පිඹුරු අංක 645 හි ලොට් බී 3 ද, දකුණ සහ බටහිරට : ජනතා මාවත, නැගෙනහිරට සහ බටහිරට : එම්. ඩී. අයිරින්ගේ ඉඩම ද, නැගෙනහිරට සහ බටහිරට : ලොට් බී 2 ඒ ද මායිම් වූ ප්‍රමාණයේ පර්චස් අටයි දශම අටයි බිංදුවක් (පර්. 8.80) විශාල ඉඩම සහ එහි පිහිටි ගහකොළ පළතුරු ආදී සෑම සියලු දේ ද වේ. මෙය දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 113/45 හි ලියාපදිංචි වී ඇත.

*ගෙවීම් ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

(1) ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් 25%ක මුදලක්, (2) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය ප්‍රකාරව වන ගෙවීම් (3) රජයේ ගාස්තු හෝ පළාත් පාලන ආයතන ගාස්තු හෝ විකිණීම සම්බන්ධයෙන් වූ වෙනත් වියදම් (4) ගැණුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑ පහක (75%) මුදල දින 30ක් ඇතුලත කොළඹ දිසා අධිකරණයේ ඉහත සඳහන් නඩුවට තැන්පත් කළ යුතු ය.

*දේපලට පිවිසීම.*- කොළඹ-මහරගම හයිලෙවල් පාරේ නාවින්න හන්දියෙන් වම්පසට ඇති පරණ මහරගම පාරේ හැරී මීටර් 100ක් පමණ ඉදිරියට යනවිට මාර්ගයේ දකුණුපසට හමුවන ජනතා මාවතට හැරී මීටර් 600ක් යනවිට මාර්ගයේ වම්පසට වන්නට මෙම විෂයගත දේපළ පිහිටා ඇත.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
නුගේගොඩ.

වර්ෂ 2023ක් වූ ඔක්තෝබර් මස 05 වැනි දින,
නුගේගොඩ දිසා අධිකරණයේ දී ය.

10-151

---

# විවිධ දැන්වීම්

## ගණන් බේරා වසා දැමීම පිළිබඳ දැන්වීම

කොළඹ දී පැවැත්වෙන (ස්වකීය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන) බස්නාහිර පළාත් මහාධිකරණයේ දී ය

2007 අංක 07 දරන සමාගම් පනතේ XII වන පරිච්ඡේදය යටතේ අධිකරණය මගින් ගණන් බේරා වසා දැමීමට කරනු ලබන ඉල්ලීම පිළිබඳ කාරණාවේ දී ය

නඩු අංකය : CHC 66/2023/CO
ස්වභාවය : සමාගම්
කාර්ය පටිපාටිය : ලඝු

රත්මලාන, අත්තිඩිය, කටුකුරුඳුවත්ත පාර, අංක 1-1/1 දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පිහිටි සූම් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් [පෙර හැරඩ්ස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්] (PV64201)

චාල්ස් රොහාන් රවීන්ද්‍ර ද අල්විස්,
අංක 148/5,5 වන පටුමග,
ඇන්ඩර්සන් පාර, දෙහිවල.
...........................*පෙත්සම්කරු.*

රත්මලාන, අත්තිඩිය, කටුකුරුඳුවත්ත පාර, අංක 1-1/1 දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පිහිටි සූම් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෙර හැරඩ්ස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් (PV 64201) සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා 2023 අගෝස්තු මස 25 දිනැති පෙත්සමක් කොළඹ දී පැවැත්වෙන (ස්වකීය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන) බස්නාහිර පළාත් මහාධිකරණයට ඉදිරිපත් කර ඇති බවත්, එකී පෙත්සම පිළිබඳ විමසීම **2023 දෙසැම්බර් මස 14 වැනි දිනට** නියම කර ඇති බවත්, එකී පෙත්සම සම්බන්ධව නියෝගයක් කිරීම සම්බන්ධයෙන් පාක්ෂිකව හෝ විරුද්ධව කරුණු දැක්වීමට අදහස් කරන එම සමාගමේ කවර හෝ ණයහිමියෙකුට හෝ දායකයෙකුට තම අදහස වෙනුවෙන් එකී විමසීම කරණ අවස්ථාවේ දී පෞද්ගලිකව හෝ ලේඛණගත නීතිඥවරයෙකු මගින් පෙනී සිට කරුණු දැක්විය හැකි බවත්, පෙත්සමේ පිටපතක් නියමිත ගාස්තු ගෙවීම මත එහි කවර හෝ ණය හිමියෙකුට හෝ දායකයෙකුට පහත අත්සන් කරන නීතිඥතැනගෙන් ඉල්ලා සිටි විට ලබාගත හැකි බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

නීතිඥ ඩයනි සී. මිල්ලවිතානාච්චි
අංක 492/D/S, වැව පාර, ඇවරිහේන, හෝකන්දර.

***සටහන.***- මෙම පෙත්සම විමසීමට ගන්නා අවස්ථාවේ දී පෙනී සිටීමට බලාපොරොත්තු වන කවර හෝ පුද්ගලයෙකු එසේ කිරීමට ඇති සිය අදහස ඉහත නම් සඳහන් නීතිඥ ඩයනි සී. මල්ලවිතානාච්චි වෙත ලිඛිතව දන්වා භාරදිය යුතුය. *නැතහොත්* ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. දැනුම්දීම කරන පුද්ගලයාගේ නම සහ ලිපිනය ද, සමාගමක් වේ නම් එම සමාගමේ නම සහ ලිපිනය ද දැන්වීමේ සඳහන් කළ යුතු අතර, පුද්ගලයා විසින් හෝ සමාගම විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ ලේඛණගත නීතිඥ විසින් අත්සන් කළ යුතු අතර **2023 අගෝස්තු මස 24 දින පස්වරු 4.00** ට පෙර භාර දිය යුතුය. ලියාපදිංචි තැපැල් මගින් එවන්නේ නම් ඉහත සඳහන් නීතිඥතැනගේ ලිපිනයට උක්ත දිනට පෙර ලැබෙන ලෙසට ප්‍රමාණවත් කාලයක් සහිතව එවිය යුතුය.

පෙත්සම්කරුගේ ලේඛණගත නීතිඥ.

10-167

**ස්වකීය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණයේ දී ය**

ගණන් බේරා වසා දැමීම පිළිබඳ දැන්වීම

නඩු අංකය : CHC/62/2023/CO
ස්වභාවය : සමාගම ඈවර කිරීම
කාර්ය පටිපාටිය : ලඝු

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ xii පරිච්ඡේදය ප්‍රකාරව ලියාපදිංචි අංක පී. වී. 3730 දරන මොරටුව, හොරේතුඩුව, පළවන පටුමග, අංක 43/3A හි ස්වකීය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබන අනුර සිසිල් බීම (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගමේ ශ්‍රී ලංකාව තුළ ඇති වත්කම් ගරු අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා වූ ඉල්ලීමක් සම්බන්ධ කාරණාව පිළිබඳවයි.

මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී. එල්. සී.
(පෙර එම්. සී. එස්. එල්. ෆයිනෑන්ෂල් සර්විසස් ලිමිටඩ් සහ
සීලිස් ලිමිටඩ් සහ සීලිස් ෆිනෑන්සියල් සර්විසස් ලිමිටඩ්)
බෑන්ක් ඔෆ් සිලෝන් මර්චන්ට් ටවර්,
අංක 28, ශාන්ත මයිකල් පාර,
කොළඹ 03.

................*පෙත්සම්කරු*.

ස්වකීය සිවිල් අධිකරණය බලය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය විසින් ඉහත නම් සඳහන් සමාගමේ ශ්‍රී ලංකාව තුළ ඇති වත්කම් අධිකරණය විසින් ගණන් බේරා වසා දමනු ලැබීම සඳහා කොළඹ 03, ශාන්ත මයිකල් පාර, අංක 28, බැන්ක් ඔෆ් සිලෝන් මර්චන්ට් ටවර් හි සිය ප්‍රධාන ව්‍යාපාරික කාර්යාලය පිහිටා ඇති මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී විසින් **2023 ක් වූ අගෝස්තු මස 09** වැනි දින පෙත්සමක් ඉදිරිපත් කරනු ලැබූ බවත් එකී පෙත්සම 2023 ක් වූ දෙසැම්බර් මස 05 වැනි දින අධිකරණය ඉදිරියේ විමසීම සඳහා නියම කරනු ලැබූ බවත් එකී පෙත්සම සම්බන්ධ නියෝගයක් කිරීම සඳහා සහය දීමට හෝ ඊට විරුද්ධවීමට කැමැත්තක් දක්වන එකී සමාගමේ කවර හෝ ණය හිමියෙකුට හෝ සහදායකයෙකුට එම අරමුණ වෙනුවෙන් එකී විමසීම කරන අවස්ථාවේ පුද්ගලිකව හෝ සිය නීතිඥ මගින් පෙනී සිටිය හැකි බවත්, පෙත්සමේ පිටපතක් අවශ්‍ය සමාගමේ කවර හෝ ණය හිමියෙකුට හෝ සහදායකයෙකුට නියමිත ගාස්තු ගෙවීම මත පහත අත්සන් කරනු ලබන අය විසින් එය සපයනු ලබන බවත්, මෙයින් නිවේදනය කරනු ලැබේ.

නීතිඥ තෙරංජනී අත්තනායක,
නීති අංශය,
මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී,
බෑන්ක් ඔෆ් සිලෝන් මර්චන්ට් ටවර් ගොඩනැගිල්ල,
අංක 28, ශාන්ත මයිකල් පාර, කොළඹ 03.

***සැලකිය යුතුයි***.- එකී පෙත්සම සම්බන්ධ විමසීමේ දී පෙනී සිටීමට අදහස් කරන කවර හෝ පුද්ගලයෙකු එසේ කිරීමට ඇති සිය අදහස ඉහත නම් සඳහන් නීතිඥ තෙරංජනී අත්තනායක වෙත ලිඛිතව දන්වා හරදිය යුතුය. *නැතහොත්* තැපෑලෙන් එවිය යුතුය. දැනුම්දීම කරන පුද්ගලයාගේ නම සහ ලිපිනය ද, සමාගමක් වන සමාගමේ නම සහ ලිපිනය ද දැන්වීමේ ප්‍රකාශ කළ යුතු අතර එකී පුද්ගලයා හෝ සමාගම විසින් හෝ ඔහුගේ ඔවුන්ගේ (නීතිඥවරයෙකු සිටී නම්) නීතිඥවරයා හෝ නීතිඥවරිය විසින් අත්සන් කළ යුතු අතර, **2023 ක් වූ දෙසැම්බර් මස 05** වැනි දිනට පෙර භාරදිය යුතු ය. *නැතහොත්* තැපැල් මගින් එවන්නේ නම් ප්‍රමාණවත් කාලයක් ඇතුළත දී තැපැල් මගින් එවිය යුතුය.

10-153

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

### ජීවිතය පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

විමලවීර දිසානායක වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 53 දරන ස්ථාවර නියෝගය යටතේ "ජීවිතය පදනම'' සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි, යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථ වලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි :-

*(අ)* කාන්තාවන් හා ළමුන්ගේ සියලුම අයිතීන් ප්‍රවර්ධනය කිරීම ;

*(ආ)* සිසුන්ට අධ්‍යාපනය, ක්‍රීඩා සහ කලා කටයුතුවලට උපකාර කිරීම ;

*(ඇ)* මානව සුභසිද්ධිය සඳහා සහායවීම සහ උපකාර කිරීම ;

යනාදිය වේ.

විමලවීර දිසානායක,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

10-147

---

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

### උඩුනුවර සංවර්ධන භාරය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

වේලුකුමාර් වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 53 දරන ස්ථාවර නියෝගය යටතේ "උඩුනුවර සංවර්ධන භාරය'' සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි, යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී භාරය සංස්ථාගත කිරීමයි :-

*(අ)* විෂය මාලා, විෂය සමගාමී සහ විෂය බාහිර ක්‍රියාකාරකම්වල උපරිම දක්ෂතාවය පෙන්නුම් කිරීමට හැකි වන පරිදි පාසල් දරුවන් සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීම ;

*(ආ)* අවශ්‍ය දැනුම සහ පුහුණුව ලබා දීම මගින් සහ අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් ජනතාවගේ ආර්ථිකය සහ සෞඛ්‍යය නංවාලීමට කටයුතු කිරීම ;

*(ඇ)* ජාතීන් අතර සමගිය සහ සංහිඳියාව වර්ධනය කිරීමේ අරමුණින් උඩුනුවර සංවර්ධන භාරය විසින් ක්‍රියාත්මක කරනු ලබන සියලුම වැඩසටහන්වල සියලුම ජාතීන්ට අයත් ජනතාව සහභාගී වී සේවාවන් ලබාගැනීමට හැකි වීම ;

යනාදිය වේ.

වේලුකුමාර්,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

10-148

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

### තුලිකල් භාරකාර අරමුදල සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

කුලසිංගම් තිලීබන් වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 53 දරන ස්ථාවර නියෝගය යටතේ "තුලිකල් භාරකාර අරමුදල' සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි, යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී අරමුදල සංස්ථාගත කිරීමයි :-

*(අ)* රටේ සමාජයීය, සංස්කෘතික හා ආර්ථික සංවර්ධනයට සහභාගී වීමට ;

*(ආ)* විනය හා සංස්කෘතික සාරධර්මයන් ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම සඳහා විධිවිධාන සැලැස්වීම ;

*(ඇ)* ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම සඳහා ආධාර ලබාදීම

යනාදිය වේ.

කුලසිංගම් තිලීබන්,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

10-149

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.